*සැ. යු.* - 2024.03.28 වැනි දින පළ වූ අංක 2378 *ගැසට් පත්‍රයේ* VI කොටසේ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ ලියාපදිංචි පශු වෛද්‍යවරුන්ගේ වෘත්තිකයන්ගේ නාමාවලියේ ලියාපදිංචි දිනය 2020.07.20 ලෙස සඳහන් වී ඇත. එය 2024.03.01 ලෙස නිවැරදි විය යුතුය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,380 - 2024 අප්‍රේල් මස 10 වැනි බදාදා - 2024.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.*- අල් ෆලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2024 මාර්තු මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මැයි මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාල යට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 - B 082560 — 5, 403 (2024/04)
F 1 -

# පළාත් සභා නිවේදන

## ඌව පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

2001 අංක 01 දරන ඌව පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා අධිකාරියේ හා 2019 අංක 02 දරන (සංශෝධිත) ඌව පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 1 කොටස 07 (ආ) වගන්ති ප්‍රකාරව, II කොටස 20 වන වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සහ 2024.03.02 වන දිනැතිව ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ අංක 6/ආ/6/1 දරන ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හා ඌව පළාත් ප්‍රවාහන සේවා අධිකාරි ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අංක UTA/DBD/2024/01/02 යටතේ 2024.03.15 වැනි දිනැතිව යොමු කළ යෝජනාවට ලබා දුන් අනුමැතිය පරිදි මෙයට අමුණා ඇති උපලේඛනයේ සඳහන් ගාස්තු ඌව පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ කටයුතුවල දී *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මකවන බව සියලුම පුරවැසියන්ගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

කේ. සුසිල් කුමාර,
සභාපති,
ඌව පළාත් මඟී ප්‍රවාහන සේවා අධිකාරිය.

**නව ගාස්තු සංශෝධන**

| *අ අ* | *නව ගාස්තු සංශෝධන* | *ගාස්තු (රුපියල්)* |
|---|---|---|
| 1 | විශේෂ චාරිකා බලපත්‍ර ගාස්තු සංශෝධනය : | |
| | පළමු දිනට | 400 0 |
| | වැඩි වන සෑම දිනකට ම | 150 0 |
| 2 | බස් රථය ඔමිනි කිරීමේ ලිපි නිකුත් කිරීම සඳහා | 2,000 0 |
| 3 | කලත්‍රයා මිය ගියහොත් හෝ අකර්මන්‍ය වූ විට ලිපි ලේඛන ගාස්තු පමණක් අය කර මාර්ග බල පත්‍රය පැවරීමට කටයුතු කිරීම | 15,000 0 |
| 4 | බලපත්‍ර හිමිකරුගේ දරුවන්ට පැවරීමේ දී | 53,500 0 |
| 5 | බස් රථය පළාතෙන් නිදහස් කිරීමට | 3,000 0 |
| 6 | නව මාර්ග බලපත්‍ර ඉල්ලීමේ දී අයදුම්පත් ගාස්තුව වශයෙන් | 5,000 0 |
| 7 | සිසු සැරිය නව බලපත්‍ර නිකුත් කිරීමේ දී බලපත්‍ර ගාස්තු වශයෙන් | 1,50,000 0 |
| 8 | මෙම අධිකාරියෙන් නිකුත් කරන ලද වලංගු මාර්ග බලපත්‍රයක් හිමි තැනැත්තෙකු සිසු සැරිය මාර්ග බලපත්‍රයක් ඉල්ලුම් කරන්නේ නම්, | 150,000 0 |
| 9 | සිසු සැරිය සේවාව සඳහා ඇතුල්වීමේ දී පරිපාලන ගාස්තු | 20,000 0 |
| 10 | මාර්ග බලපත්‍ර පොත අස්ථාන ගත වූ විට එය නැවත ලබා ගැනීමේ දී | 20,000 0 |
| 11 | ලේබලය අස්ථානගත වූ අවස්ථාවක එය නැවත ලබා දීමේ දී | 5,000 0 |
| 12 | මාර්ග සංශෝධන | 125,000 0 |
| 13 | ආසන වෙන් කිරීමේ ආදායම් | 50 0 |
| 14 | බස් නැවතුම්පොල භූමිය වෙන් කිරීමේ ගාස්තු | 10,000 0 |
| 15 | නැවතුම්පොල ගාස්තු (අන්තර් පළාත්) | 12,000 0 |
| 16 | මඟී ආරක්ෂණ අරමුදල වෙනුවෙන් (නව) | 500 0 |
| 17 | ලොග්පත්‍ර ගාස්තු | 1,300 0 |
| | පිවිසුම් ගාස්තු | 1,560 0 |
| | අතුරුමාර්ග බලපත්‍ර ගාස්තු | 1,000 0 |
| | ප්‍රමාද ගාස්තු (සතියට) | 250 0 |

| අ අ | නව ගාස්තු සංශෝධන | ගාස්තු (රුපියල්) |
|---|---|---|
| 18 | රියැදුරු හැඳුනුම්පත් ගාස්තු : | |
| | නව ගාස්තු | 3,125 0 |
| | දීර්ඝ කිරීමේ ගාස්තු | 1,875 0 |
| | ප්‍රමාද ගාස්තු | 100 0 |
| 19 | කොන්දොස්තර බලපත්‍ර ගාස්තු : | |
| | නව ගාස්තු | 3,750 0 |
| | දීර්ඝ කිරීමේ ගාස්තු | 2,500 0 |
| | ප්‍රමාද ගාස්තු | 100 0 |
| 20 | නව මාර්ග බලපත්‍ර ගාස්තු : | |
| | 0-10 KM | 200,000 0 |
| | 11-20 KM | 250,000 0 |
| | 21-30 KM | 300,000 0 |
| | 31-40 KM | 350,000 0 |
| | 41-50 KM | 400,000 0 |
| | 50 KM ට වැඩි | 500,000 0 |
| | සුඛෝපභෝගී බස්රථ සඳහා | 500,000 0 |
| 21 | මාර්ග බලපත්‍ර පැවරීම් ගාස්තු : | |
| | 0-10 KM | 200,000 0 |
| | 11-20 KM | 250,000 0 |
| | 21-30 KM | 300,000 0 |
| | 31-40 KM | 350,000 0 |
| | 41-50 KM | 400,000 0 |
| | 50 KM ට වැඩි | 500,000 0 |
| | සුඛෝපභෝගී බස්රථ සඳහා | 500,000 0 |
| | (මින් ඉදිරියේ දී අවුරුදු 05 ට අඩු/වැඩි ලෙස වෙන් වෙන් ගාස්තු අය නොකිරීමට තීරණය කරන ලදී.) | |
| 22 | තාවකාලික අවසරපත්‍ර ගාස්තු (දිනකට) : | |
| | 0-10 KM | 400 0 |
| | 11-20 KM | 500 0 |
| | 21-30 KM | 600 0 |
| | 31-40 KM | 700 0 |
| | 41-50 KM | 750 0 |
| | 50 KM ට වැඩි | 800 0 |
| | අන්තර් පළාත් | 1,000 0 |

| අ අ | නව ගාස්තු සංශෝධන | ගාස්තු (රුපියල්) |
|---|---|---|
| 23 | වාර්ෂික බලපත්‍ර ගාස්තු : | |
| | 0-10 KM | 7,980 0 |
| | 11-20 KM | 8,400 0 |
| | 21-30 KM | 9,800 0 |
| | 31-40 KM | 10,500 0 |
| | 41-50 KM | 11,200 0 |
| | 50 KM ට වැඩි | 11,900 0 |
| | සුඛෝපභෝගී බස්රථ සඳහා | 16,800 0 |
| | ප්‍රමාද ගාස්තු දිනකට | 250 0 |
| 24 | නව මාර්ග බලපත්‍රයක් නිකුත් කිරීමේ දී මාර්ග පරීක්ෂණ වාර්තාව සඳහා ගාස්තු අය කිරීම ( මාර්ග බලපත්‍රය අනුමත වුවහොත් පමණි.) | |
| | 0-10 KM | 10,000 0 |
| | 11-20 KM | 12,500 0 |
| | 21-30 KM | 15,000 0 |
| | 31-40 KM | 17,500 0 |
| | 41-50 KM | 20,000 0 |
| | 50 KM ට වැඩි | 22,500 0 |
| | සුඛෝපභෝගී බස්රථ සඳහා | 25,000 0 |
| | මාර්ගය ආරම්භ වන ස්ථානයට යාමට සහ ඒමට 1 KM ක් සඳහා ගමන් ගාස්තු | 150 0 |
| 25 | පළාත් මාර්ග බලපත්‍ර මාර්ග දීර්ඝ කිරීමේ ගාස්තු : | |
| | 0-10 KM | 15,000 0 |
| | 11-20 KM | 20,000 0 |
| | 21-30 KM | 25,000 0 |
| | 31-40 KM | 30,000 0 |
| | 41-50 KM | 35,000 0 |
| | 50 KM ට වැඩි | 40,000 0 |
| | සුඛෝපභෝගී බස්රථ සඳහා | 45,000 0 |
| 26 | පාසල් සිසුන් ප්‍රවාහන බස්රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු (නව) | 10,000 0 |
| 27 | ත්‍රී රෝද රථ බලපත්‍ර ලියාපදිංචි ගාස්තු (නව) | 5,000 0 |
| 28 | කර්මාන්ත ශාලා රථ ලියාපදිංචි ගාස්තු (නව) | 10,000 0 |
| 29 | කාර්යාල සේවා ලියාපදිංචි ගාස්තු (නව) | 10,000 0 |
| 30 | පාසල් සිසුන් ප්‍රවාහන බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු (නව) | 5,000 0 |
| 31 | ත්‍රී රෝද රථ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු (නව) | 500 0 |
| 32 | කර්මාන්තශාලා සේවක ප්‍රවාහන බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු (නව) | 5,000 0 |
| 33 | කාර්යාල සේවක ප්‍රවාහන බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු (නව) | 5,000 0 |

| *අ අ* | *නව ගාස්තු සංශෝධන* | *ගාස්තු (රුපියල්)* |
|---|---|---|
| 34 | බස් රථ ආදේශ කිරීම් ගාස්තු පළාත තුළ | 5,000 0 |
| 35 | බස් රථ ආදේශ කිරීම් ගාස්තු - අන්තර් පළාත්/පිවිසුම් | 10,000 0 |
| 36 | ප්‍රධාන මාර්ග දීර්ඝ කිරීමේ ආදායම් - අන්තර් පළාත්/පිවිසුම් | 20,000 0 |
| 37 | පවතින මාර්ග බලපත්‍රයක් වෙනත් සේවාවකට ඇතුළත් කර ගැනීමේ ගාස්තු (සිසු සැරිය/නිසි සැරිය/ගැමිසැරිය) | 50,000 0 |
| 38 | නිදහස් ගමන් වාර අවසර පත්‍ර ගාස්තු | 2,500 0 |
| 39 | ප්‍රවේශ පත්‍ර පොත් | 750 0 |
| 40 | ලීසිං පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ලිපියක් නිකුත් කිරීමේ ගාස්තු (නව) | 500 0 |
| 41 | දෛනිකව ධාවනය වන බස් රථ වලින් නගර සභාවට ගෙවිය යුතු බස්රථ නැවතුම්පොල ගාස්තු (දිනකට) (නව) | 25 0 |

**මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

*ප්‍රවාහන අමාත්‍යාංශය - ඌව පළාත*

*බලයලත් නිලධාරියකු විසින් නිකුත් කරනු ලබන තාවකාලික අවසර පත්‍රය*

අයිතිකරුගේ නම හා ලිපිනය :............................................................................................................ බලපත්‍ර අංකය :...............................

........................................................................................................................ දු. ක. අංකය :.....................................

මාර්ග අංක .............................................. යෙහි ධාවනය වන අංක .................................. දරන මගී ප්‍රවාහන සේවා රථය පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් 1 ඡේදයේ අන්තර්ගත වැරදි සම්බන්ධයෙන් පහත II ඡේදයේ දක්වා ඇති ලියවිලි අධිකාරියේ භාරයට ගතිමි.

*1 ඡේදය*

| | *අනාවරණය වූ වැරදි* | *දඩ මුදල (රුපියල්)* |
|---|---|---|
| 1 | වලංගු මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් සන්තකයේ තබා ගැනීම පැහැර හැරීම | 3,500 0 |
| 2 | අවසර පත්‍රයේ වලංගු කාලය ඉක්මවා ධාවනය කිරීම | 5,000 0 |
| 3 | මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයේ දැක්වෙන අනුමත ගමන් මාර්ගයෙන් වෙනස්ව ධාවනය කිරීම (සාධාරණ හේතුවක් නම් දින 30 ක් ඇතුළත අධිකාරියට දැනුම් දිය යුතුයි) | 7,500 0 |
| 4 | ගමනාන්තය දක්වා ධාවනය නොකොට අතරමගදී ආපසු හරවා ධාවනය කිරීම | 15,000 0 |
| 5 | මගී ප්‍රවාහනය සඳහා බලය නොලත් බස් රථයක් පාවිච්චි කිරීම | 200,000 0 |
| 6 | පවත්වාගත යුතු යැයි අධිකාරිය විසින් නියමකර ඇති ලිපි ලේඛන පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීම පැහැර හැරීම | 4,000 0 |
| 7 | බස් රථය නවතන ලෙස බලයලත් නිලධාරියෙකු විසින් සංඥා කරනු ලැබූ විට නොනවත්වා ධාවනයේ යෙදීම | 5,000 0 |
| 8 | අනුමත කාල සටහන පිළිපැදීම පැහැර හැරීම | 5,000 0 |
| 9 | අය කරන මුදලට අදාළ ප්‍රවේශ පත්‍රයක් මගීන්ට නිකුත් කිරීම පැහැර හැරීම, ප්‍රවේශ පත්‍රයට අඩුවෙන් මුදල් අය කිරීම හෝ වැඩියෙන් මුදල් අය කිරීම (කොන්දොස්තරවරයා) | 5,000 0 |

| | *අනාවරණය වූ වැරදි* | *දඩ මුදල (රුපියල්)* |
|---|---|---|
| 10 | මාර්ග අංකය හා ආරම්භක ස්ථානය ගමනාන්තය බස් රථයේ ඉදිරිපස හා පසුපස ප්‍රදර්ශනය කිරීම පැහැර හැරීම | 5,000 0 |
| 11 | සුඛෝපභෝගී බස් රථවල, අනුමත සංඛ්‍යාව ඉක්මවා මගීන් ගෙන යෑම (එක් මගියකු සඳහා) | 1,000 0 |
| 12 | වලංගු කොන්දොස්තර බලපත්‍රය/රියැදුරු හැඳුනුම්පත්‍රය සන්තකයේ තබා නොගැනීම | 2,500 0 |
| 13 | මාසික සේවා ගාස්තුව ගෙවීම පැහැර හැරීම | 5,000 0 |
| 14 | අවසර පත්‍ර ලේබලය ඉදිරිපස වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය නොකිරීම | 1000 0 |
| 15 | වෙනස් ගමනාන්තවලට එකම වටිනාකම දක්වෙන ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම | 2,500 0 |
| 16 | අය කරන ගාස්තු චක්‍රය ප්‍රදර්ශනය නොකිරීම | 2,500 0 |
| 17 | අනුමත ආසන සංඛ්‍යාව ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| 18 | ඉදිරිපස වින්ඩ්ස්ක්‍රීනයට ඉහළින් බස් රථයේ ලියාපදිංචි අංකය ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| 19 | බස් රථය තුළ සීනුවක් සවි කර නොතිබීම | 1,000 0 |
| 20 | පූජ්‍ය පක්ෂයට, ආබාධිත තැනැත්තන් හා ගැබිනි කාන්තාවන් සඳහා වෙන් කළ ආසන දක්වෙන, දැන්වීම් ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| 21 | කොන්දොස්තරවරයා විසින් නිකුත් කරන ලද වලංගු ප්‍රවේශපතක් ගමනාන්තය දක්වා මගියා අත නොමැති නම් ගමන් ගාස්තුව මෙන් දෙගුණයක මුදලක් අය කිරීම | 1,000 0 |
| 22 | විශේෂ චාරිකා බලපත්‍ර නොමැතිව ධාවනය | 2,000 0 |
| 23 | i. අධික ශබ්දයක් සහිතව ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර ක්‍රියාකරවීම (80 db ට වැඩි) | 5,000 0 |
| | ii. අශෝභන දර්ශන ඇතුළත් වීඩියෝ පට ප්‍රදර්ශනය | 15,000 0 |
| | iii. ජංගම දුරකථනය භාවිතා කරමින් රිය පැදවීම | 10,000 0 |
| | iv. පාපුවරුවේ මගීන් ගෙන යාම | 1,000 0 |
| | v. අනුමත නැවතුම්පලින් බැහැරව මගීන් නංවා ගැනීම හා බැස්සවීම | 5,000 0 |
| | vi. බීමත් ව රාජකාරි සිදු කිරීම | 50,000 0 |
| | vii. සිසුසැරිය නියමය උල්ලංඝනය කිරීම | 15,000 0 |

### *II ඡේදය - රඳවාගත් ලියවිලි*

1. ............................................................................ සිට............................................................................ දක්වා වූ මාර්ග ධාවන බලපත්‍රය
2. වලංගු කාලය............................................................................................................................................................
3. අංක ........................................................ දරන රියදුරු හැඳුනුම්පත
4. යෝග්‍යතා සහතිකය.
5. අංක .................................................................................. දරන කොන්දොස්තර බලපත්‍රය

මෙම බලපත්‍රය වලංගු වන්නේ නිකුත් කළ දින සිට දින 14 ක් සඳහා පමණි. (ප්‍රමාද ගාස්තු දිනකට රු. 100 බැගින් අය කරනු ලැබේ.) එබැවින් ................................................................ දින හෝ ඊට පෙර මෙයට අදාළ ලියවිලි ඌව පළාත් සභාවේ 2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තියේ අංක 19 කොටසේ පොදු විධිවිධාන යටතේ නිදහස් කරගත යුතුය.

පරීක්ෂා කළ ස්ථානය :..............................................................

දිනය :...........................................................................................

වේලාව :.......................................................................................

...........................................................................
සාමාන්‍යාධිකාරී වෙනුවට බලයලත් නිලධාරී,

නම :..............................................................

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - ඌව පළාත,

................................................................. කාර්යාලය.

04-109

---

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, විධායක සේවා ගණයේ රසඥ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා වසරක කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහාවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2024

මහනුවර මහා නගර සභාවේ විධායක සේවා ගණයේ රසඥ තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා කොන්ත්‍රාත් පදනම මත සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට **2023.12.31** දිනට පහත සඳහන් සුදුසුකම් සපුරාලන ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම්.-*

1.1. පොදු සුදුසුකම් :

1.1.1. අයදුම්කරු/ අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

1.1.3. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.4. සෑම අයදුම්කරුවකු ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

1.1.5. 2023.12.31 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි අයකු විය යුතුය. (ඒ අනුව 2002.12.31 දිනට හෝ ඊට පෙර, 1988.12.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

1.2. අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින් :

(අ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ආ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ඇ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී පශ්චාත් උපාධිය ලබා තිබීම.

***සටහන*** : ඉහත උපාධිය හෝ අනෙකුත් සුදුසුකම් 2023.12.31 දිනට හෝ ඊට පෙර දිනක සපුරා තිබිය යුතුය.

02. *දීමනා ගෙවීම :*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව SL -01 - 2016 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපවන රු. 47,615/- ක් වන මූලික වැටුප පත්වීම ක්‍රියාත්මකවන දින සිට ගෙවනු ලැබේ.

මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

03. *සේවා කොන්දේසි :*

3.1. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023.05.30 දිනෙන් අනුමත කර ඇති මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවේ විධායක සේවා ගණයේ රසඥ තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියෙහි කර ඇති හා මින්මතු සිදුකෙරෙන සංශෝධනයන් සඳහා ද යටත් වනු ඇත.

3.2 වසරක කාල සීමාවක් සඳහා පමණක් මෙම කොන්ත්‍රාත් කාලය වලංගුවන අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී මෙම කොන්ත්‍රාත් පදනමින් ලබා දෙන්නා වූ පත්වීම අහෝසි කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

4.1 අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියකට අනුව ලකුණු පිරිනමා, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

***සටහන*** : සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

05. *අයදුම් කිරීමේ ක්‍රමය :*

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර" යන ලිපිනයට **2024.05.03 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, රසඥ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් , අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.)

06. සියලුම අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා බලා තේරුම්ගත යුතුය.

07. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

08. මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

2024 අප්‍රේල් මස 04 වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, විධායක සේවා ගණයේ රසඥ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා වසරක කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2024*

අංකය :- ..........

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

පදිංචි දිස්ත්‍රික්කය :- ..........

01. 1.1 මුලකුරු සමඟ නම :- ..........
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :- ..........
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :- ..........

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- ..........

2.2 කැඳවීමේ ලිපි එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- ..........

2.3 කැඳවීමේ ලිපි එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් කාර්යාලයීය ලිපිනය :- ..........

2.5 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :- 0 - පුරුෂ 1- ස්ත්‍රී ☐

03. 3.1 උපන් දිනය :- | | | | | | | | |

3.2 සුදුසුකම් සළකා බැලීමේ අවසන් දිනට (2023.12.31) වයස :- අවු. :...................... මාස :.......................... දින :......................

3.3 ජංගම දුරකථන අංකය :- | | | | | | | | | | |

04. විවාහක/අවිවාහක බව :- ☐

අවිවාහක - 1 විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................................................

| ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. 06.1 අධ්‍යාපන සුදුසුකම් :

| *විශ්වවිද්‍යාලයේ හෝ ආයතනයේ නම* | *ලබා ඇති උපාධිය හෝ සමත් විභාගය* | *උපාධියට හෝ විභාගයට හදාරා ඇති විෂයයන්* | *ලැබූ පන්ති සාමාර්ථය* | *සහතිකපත් අංකය හා උපාධිය හෝ විභාගය වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

06.2 ලබා ඇති අනෙකුත් වෘත්තීය සුදුසුකම් :-

07. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්) :-

| *දෙපාර්තමේන්තුව/ ආයතනය* | *දැරූ තනතුර* | *කාලය* | | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

08. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා ඇතිද /නැතිද යන වග :..........................................................................................

දඬුවම් ලබා ඇත්නම්, විස්තර දක්වන්න. : ..........................................................................................

**අයදුම්කරුගේ ප්‍රකාශය**

09. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශකර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මා දනිමි.

.........................................   .............................................,
දිනය   අයදුම්කරුගේ අත්සන.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු / ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

***සටහන*** :- සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු.498 960/-ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

දිනය :-................................   ...............................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :-........................................................................................
තනතුර :- ........................................................................................
ලිපිනය :-..........................................................................................

11. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම අයදුම්කරු වන ...................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................................................................ වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි බවත් සහතික කරමි.

...................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :-.....................................

04-240

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.